**ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂය**
**இலங்கை கம்யூனிஸ்ட் கட்சி**
**COMMUNIST PARTY OF SRI LANKA**

# ත්‍රස්තවාදි බෝම්බ ප්‍රහාරය පිළිබඳ ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂයේ ප්‍රකාශය

ඉකුත් පාස්කු ඉරිදා දේවස්ථාන සහ හෝටල් එල්ල කොට සිදුකළ ත්‍රස්තවාදී ප්‍රහාරයන් නිසා අහිමි වු අහිංසක ජීවිත පිළිබඳව ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂය සිය බලවත් කම්පනය, ශෝකය සහ කනස්සල්ල ප්‍රකාශකරයි. එය පැහැදිලිවම ශ්‍රී ලංකාවේ ආත්මයටම එල්ල කළ මේලේච්ඡ, සාහසික ප්‍රහාරයකි. 26 වසරක කුරිරු යුද්ධය අවසන් වී වසර දහයක් ගෙවී යන මොහොතේ එය සිදුවීම, ගතවු දශක ගණනක් තිස්සේ සිදුවු ජීවිත සහ දේපල විනාශය යළි මතකයට පත් කිරීමකි.

දැනට අනාවරණය වී ඇති සාක්ෂිවලට අනුව, එම ප්‍රහාරය , සැලසුම් ගත අරමුණකින් යුක්ත, සංවිධානාත්මක ලෙස මෙහෙයවනු ලැබ ඇති අන්තවාදී ත්‍රස්තවාදී ක්‍රියාවක් බව පැහැදිලිය. එය ජාත්‍යන්තර ස්වරූපයේ ප්‍රහාරයක ලක්ෂණවලින් යුක්තය. ප්‍රහාර ත්‍රස්තවාදීන්ගේ අරමුණ, ශ්‍රී ලාංකීය, සමාජය අස්ථාවර කිරීම, ආර්ථිකය බිඳ දැමීම, විවිධ වු ජනවාර්ගික සහ ආගමික ප්‍රජාව තුළ අන්නෝන්‍ය බිය සහ සැකය ඇති කිරීම, ප්‍රතික්‍රිය උසිගැන්වීමක් බව පැහැදිලිය. මෙහි පිටුපස ක්‍රියාත්මක වු අන්තවාදී බලවේගයන් සහ මත්ද්‍රව්‍ය මාපියාව අතර සබඳතා ඇතැයි සිතිම බැහැරකළ නොහැකිය. ජාත්‍යන්තර සහ භූ දේශපාලන සාධක සැලකිල්ලට ගත් කළ, ත්‍රස්තවාදය මැද පෙරදිග කලාපයෙන් දකුණු ආසියානු කලාපයට මාරුවීමක් දැකිය හැකිය.

අප දකින ආකාරයට, පටු දේශපාලනයෙන් ඔබ්බට ගොස් සියලු දේශපාලන පක්ෂවල දැඩි අවධානය යොමු විය යුතු බිහිසුනු දේශපාලන ප්‍රපංචයකි.

ශ්‍රී ලාංකීය ජනතාව ඉල්ලා සිටින ජාතික සමගිය, සිහිබුද්ධිය, හා ආගමික සංහිඳියාව සඳහා සියලු ආගමික නායකයින් සෘජු ලෙස නායකත්වය සැපයිය යුතුය. සුවිශේෂීව, උද්ඝතවිය හැකි අනතුර පිළිබඳව සියළු වාමගාමී ප්‍රගතිශීලි බලවේගයන් අවබෝධයෙන් යුතුව ක්‍රියා කිරීමේ අවශ්‍යතාවය පැන නැගීතිබේ. අන්තවාදී ප්‍රවනතා සඳහා වු කොන්දේසි නිර්මාණයවීමට ඉඩ නොතැබිය යුතුය.

ත්‍රස්තාවාදී ක්‍රියාවල ප්‍රභවය සොයයෑම පමණක් නොව ජාතික ආරක්ෂාවේ අතපසුවීමක් සහ බුද්ධි අංශයේ අනතුරු හැගවීම නොසලකා හැරීමක් සිදුවුයේ දැයි රජය විමර්ශනය කළ යුතුය.

ඩිව් ගුණසේකර

ප්‍රධාන ලේකම්